<u>**ලංසු සඳහා යෝජනා කැඳවීම**</u>

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

**උපදෙස් හා කොන්දේසි**

ප්‍රතිපාදන සම්පාදනය - සභා මුදල්

1. මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් පහත සඳහන් ව්‍යාපෘති සඳහා වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය මගින් අවශ්‍ය යෝග්‍යතාවය සහ සුදුසුකම් සහිත ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු ඇරයුම් කරනු ලැබේ.

| අනු අංකය | වැඩ යෝජනාව | ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තු | ආපසු ගෙවන ලංසු සුරක්ෂණය | ඇස්තමේන්තු මුදල ( වැට් රහිත ) |
|---|---|---|---|---|
| 01 | මාලිගාතැන්න පටුමඟ පාර | 1500.00 | 6000.00 | 392945.54 |
| 02 | කටුවන්ගොඩ පියද්දෙගොඩ පාර (ඇඩ්වින් මහතාගේ නිවස අසල සිට ) | 1500.00 | 34100.00 | 2271301.70 |
| 03 | කොම්පෝස්ට් අංගනයේ මිදුලේ කඩා ඉවත්කර ඇති කොන්ක්‍රීට් කොටස නැවත කොන්ක්‍රීට් කිරීම හා කොම්පෝසට් සැකසුම් තලය කොන්ක්‍රීට් දමා අළුත්වැඩියා කිරීම. | 1500.00 | 4500.00 | 298032.54 |

<u>**කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා පහත යෝග්‍යතා සපුරා තිබිය යුතුය. අනෙකුත් කරුණු ප්‍රසම්පාදන ලේඛන වල අන්තර්ගත වේ.**</u>

02.2026 වර්ෂය සඳහා මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ඉදිකිරීම් සඳහා ලියාපදිංචි හා මුදල් චක්‍රලේඛ 4/2016 (iii) අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA )ගොඩනැලි සඳහා ලියාපදිංචි **C 9** හා **C 9** න් ඉහල ශ්‍රේණිවල කොන්ත්‍රාක්කරුවන් හට කොන්ත්‍රාත්තුව පිරිනමනු ලබයි.

03.ලංසු ලේඛන 2026.09.04 **දින සිට 2026.09.17.** දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.2.30 දක්වා කාලය තුල ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කොට **රු.1500.00** ක ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුවක් ගෙවා **මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ පෙරටු කාර්යාලයෙන්** ලබාගත හැක.

04.ලංසු යෝජනා **2026.09.17 දින ප.ව.3.00** ට පෙර මෙහි සඳහන් ආකාරයට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙත ලැබීමට සැලැස්වීමෙන් ලංසුපත් ඉදිරිපත් කල හැක.

- **ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කුරිය තැපැලෙන් එවීම**
- **කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම.**

- **ප්‍රාදේශීය සභා ගරු සභාපති/ලේකම් වෙත භාර දීම.**

05.ලංසු ඉදිරිපත් කිරීමේදී ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතු අතර මෙම සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් බැංකු ඇපකරයක් මඟින් හෝ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙත මුදල් තැන්පතුවකින් තැබිය හැක.

06. මුදල් තැන්පතුවක් නම් රිසිට් පතේ මුල් පිටපත ලංසුවේ මුල් පිටපත සමඟ අමුණා භාර දිය යුතුයි.

07. ලංසු සුරක්ෂණය ලංසු පතෙහි සඳහන් ආකෘතිය පරිදිම විය යුතුයි.

08. මෙම සුරක්ෂණය ලංසුපත් විවෘත කරන දින සිට දින 77 ක් දක්වා වලංගු විය යුතුයි.

09. ඔබගේ ලංසුපත් මුල් පිටපත හා අනු පිටපත ලෙස පැහැදිලිව සඳහන් කර නැවත ඒම පිටපත් දෙක ඒක් කවරයක බහා එහි වම් පස ඉහල කෙලවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය.

10.ලංසු ලේඛන භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කෙරෙන අතර ලංසු ඉදිරිපත් කර ඇති ලංසුකරුට හෝ ඔහු විසින් බලය පවරා ඇති නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

11. අඩුපාඩු සහිත ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු ඉදිරිපත් නොකර අයදුම්පත් ලබාගන්නා අයගේ ලංසු ලේඛන ගාස්තු රජයේ ආදායමට බැර කිරිමට හැකිය.

12.. වැඩිදුර තොරතුරු සඳහා පහත සඳහන් කාර්යාලීය වෙබ් අඩවිය භාවිතා කරන්න.

**වෙබ් අඩවි ලිපිනය - www.malimbadaps.lk**
**ලිපිනය -මාලිම්බඩ ප්‍රාදේශීය සභාව, මාලිම්බඩ, පාලටුව.**
**දූරකථන අංකය - කාර්යාලය - 041-2240208** (ලේකම් හෝ කර්මාන්ත විෂය නිලධාරී)
**ෆැක්ස් අංකය - 041-2240093**
**ඊ මේල් ලිපිනය - malimbada.ps@gmail.com**

සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ ,
පාලටුව.